# මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම

(මහා මාර්ග අමාත්‍යාංශය)

## ඇබෑර්තු

මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ පාලනය වන දිවයිනේ ප්‍රමුඛතම මාර්ග ඉදිකිරීම් සමාගමක් වන අතර එහි පහත තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සිවිල් ඉංජිනේරු - (තනතුරු 07)**

**අවශ්‍ය සුදුසුකම්**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පිළිගත් විශ්වවිද්‍යාලයක සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම සමඟ මාර්ග ඉදිකිරීම් හා නඩත්තු කිරීම් පිළිබඳව වසර 03 ක සේවා පළපුරුද්දක් සහිත වීම

හෝ

සිවිල් ඉංජිනේරු විද්‍යා තාක්ෂණය පිළිබඳව ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හෝ ඒ හා සමාන සුදුසුකම සමඟ මාර්ග ඉදිකිරීම් හා නඩත්තු කිරීම් පිළිබඳව පශ්චාත් සුදුසුකම සහිතව වසර 08 ක සේවා පළපුරුද්දක් සහිත වීම

**යාන්ත්‍රික ඉංජිනේරු - (තනතුරු 04)**

**අවශ්‍ය සුදුසුකම්**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පිළිගත් විශ්වවිද්‍යාලයක යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම සමඟ රථ වාහන, බර යන්ත්‍රෝපකරණ, පෙරමුසු අංගන, ගල් ඇඹරුම් යන්ත්‍රාගාරයන්හි නඩත්තු කටයුතු පිළිබඳව වසර 03 ක සේවා පළපුරුද්දක් සහිත වීම

හෝ

යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා තාක්ෂණය පිළිබඳව ජාතික ඩිප්ලෝමා පාඨමලාව හෝ ඒ හා සමාන සුදුසුකම සමඟ රථ වාහන, බර යන්ත්‍රෝපකරණ, පෙරමුසු අංගන, ගල් ඇඹරුම් යන්ත්‍රාගාරයන්හි නඩත්තු කටයුතු පිළිබඳව පශ්චාත් සුදුසුකම සහිතව වසර 08 ක සේවා පළපුරුද්දක් සහිත වීම

**කැණීම් ඉංජිනේරු - (තනතුරු 01)**

**අවශ්‍ය සුදුසුකම්**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පිළිගත් විශ්වවිද්‍යාලයක කැණීම් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව උපාධිය හෝ ඒ හා සමාන සුදුසුකම සමඟ A ශ්‍රේණියේ ගල් වැඩපළක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වන කැණීම් බලපත්‍රයක් සහිතව වසර 03 ක සේවා පළපුරුද්ද සහිත වීම.

**නඩත්තු හා සුරක්ෂණ නිළධාරී - (තනතුරු 01)**

**අවශ්‍ය සුදුසුකම්**

- තාක්ෂණික විද්‍යාලයෙහි ජාතික තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාව (සිවිල්/යාන්ත්‍රික/විදුලි) (National Certificate in Technology- Civil/ Mechanical/ Electrical) හදාරා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම සමඟ වසර 10 ක සේවා පළපුරුද්ද

සහ

- පරිශ්‍රව නඩත්තු කටයුතු, විදුලි ස්ථාපන කටයුතු, ගිනි සහ ආරක්ෂණ කටයුතු, වායු සමීකරණ පද්ධති සම්බන්ධ කටයුතු හා අභ්‍යන්තර දුරකථන සන්නිවේදන පද්ධති සම්බන්ධ කටයුතු යනාදියෙහි නඩත්තු කටයුතු පිළිබඳ දැනුම හා ආරක්ෂණ රෙගුලාසි හා කර්මාන්තශාලා ආඥා පනතෙහි අඩංගු කරුණු සම්බන්ධයෙන් මනා දැනුමක් සහ පළපුරුද්දක් සහිත වීම

**ප්‍රමාණ සමීක්ෂක (II ශ්‍රේණිය) - (තනතුරු 06)**

**අවශ්‍ය සුදුසුකම්**

- තාක්ෂණික විද්‍යාලයෙහි ජාතික තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාව (ප්‍රමාණ සමීක්ෂණ) (National Certificate in Technology (Quantity Surveying) හදාරා තිබීම සමඟ අදාළ ක්ෂේත්‍රයෙහි වසර 10 ක පළපුරුද්දක් සහිත වීම

**සැලසුම් ශිල්පි (IV ශ්‍රේණිය) - (තනතුරු 03)**

**අවශ්‍ය සුදුසුකම්**

- සැලසුම්ශිල්පය පිළිබඳව පුහුණු සහතික පත්‍රලාභියෙක් වීම හෝ ඒ හා සමාන සුදුසුකමත් සමඟ සැලසුම්ශිල්පියකු ලෙස වසර 03 ක පළපුරුද්දක් සහිත වීම

**කාර්මික නිළධාරී (සිවිල් / යාන්ත්‍රික / විදුලි) - (තනතුරු 23)**

**අවශ්‍ය සුදුසුකම්**

- තාක්ෂණික විද්‍යාලයෙහි ජාතික තාක්ෂණික සහතික පත්‍ර පාඨමාලාව (සිවිල් / යාන්ත්‍රික / විදුලි) (National Certificate in Technology – Civil / Mechanical / Electrical) හදාරා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම සමඟ අදාළ ක්ෂේත්‍රයෙහි වසර 10 ක සේවා පළපුරුද්ද

**වැඩ පරීක්ෂක (II ශ්‍රේණිය) - (තනතුරු 15)**

**අවශ්‍ය සුදුසුකම්**

- තාක්ෂණික විද්‍යාලයෙහි තාක්ෂණය (සිවිල්/විදුලි/යාන්ත්‍රික) පිළිබඳව ජාතික සහතික පත්‍ර පාඨමාලාව (National Certificate in Technology - Civil/Mechanical/Electrical) හදාරා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම සපුරා තිබීම

**ගබඩා පාලක (III ශ්‍රේණිය) - (තනතුරු 23)**

**අවශ්‍ය සුදුසුකම්**

- අ.පො.ස (උ/පෙළ) විභාගය වාණිජ අංශයෙන් සමත්වීම හෝ AAT දෙවන අදියර සම්පූර්ණ කර තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම සමඟ අදාළ ක්ෂේත්‍රයෙහි වසර 02 ක සේවා පළපුරුද්ද සහිත වීම.

**පර්යේෂණාගාර සහකාර (II ශ්‍රේණිය) - (තනතුරු 01)**

**අවශ්‍ය සුදුසුකම්**

- තාක්ෂණික විද්‍යාලයෙහි ජාතික සහතික පත්‍ර පාඨමාලාව (සිවිල්) (National Certificate in Technology – Civil) හදාරා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමත් සමඟ පිළිගත් ආයතනයක පර්යේෂණාගාර පරීක්ෂණ පිළිබඳව වසර 02ක පළපුරුද්දක් සහිත වීම

හෝ

- තාක්ෂණික විද්‍යාලයෙහි ජාතික සහතික පත්‍ර පාඨමාලාව (සිවිල්) (National Certificate in Technology – Civil) අර්ධ වශයෙන් අවසන් කර ඇති හෝ ඒ හා සමාන සුදුසුකමත් සමඟ පිළිගත් ආයතනයක පර්යේෂණාගාර පරීක්ෂණ පිළිබඳව වසර 05 ක පළපුරුද්දක් සහිත වීම

**කාර්මික ශිල්පි (IV ශ්‍රේණිය) - (තනතුරු 10)**

**අවශ්‍ය සුදුසුකම්**

- අ.පො.ස (සා./පෙළ) සමත් සහ ක්ෂේත්‍රයට අදාළව ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙහි (NAITA) එක් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාව සම්පූර්ණ කර තිබීම හෝ ජාතික වෘත්තීය නිපුණතා මට්ටම 4 වන අදියර (NVQ 4) සාර්ථකව අවසන් කර තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් සපුරා තිබීම සමඟ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයෙහි වසර 02 ක සේවා පළපුරුද්දක් සහිත වීම.

**විදුලි කාර්මික ශිල්පි (IV ශ්‍රේණිය) - (තනතුරු 05)**

**අවශ්‍ය සුදුසුකම්**

- අ.පො.ස (සා./පෙළ) සමත් සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙහි (NAITA) විදුලි කාර්මික ශිල්පය (Power, Auto, Electronic or Mechatronic) පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාව හදාරා තිබීම හෝ ජාතික වෘත්තීය නිපුණතා මට්ටම 4 වන අදියර (NVQ 4) සාර්ථකව අවසන් කර තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් සපුරා තිබීම සමඟ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයෙහි වසර 02 ක සේවා පළපුරුද්දක් සහිත වීම.

**යන්ත්‍රාගාර ක්‍රියාකරු (II ශ්‍රේණිය) - (තනතුරු 03)**

**අවශ්‍ය සුදුසුකම්**

- අ.පො.ස (සා/පෙළ) විභාගයට පෙනී සිටීමත් සමඟ පහත සඳහන් යන්ත්‍රාගාරවල වසර 10 ක සේවා පළපුරුද්දක් සහිත වීම

| | |
|---|---|
| ගල් ඇඹරුම් යන්ත්‍රාගාර | - පැයට ටොන් 40 ට වැඩි (40 T/H) |
| පෙරමුසු යන්ත්‍රාගාර | - පැයට ටොන් 60 ට වැඩි (60 T/H) |
| කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රාගාර | - පැයට කියුබික් මීටර් 30 ට වැඩි ($30m^3/H$) |

**යන්ත්‍ර ක්‍රියාකරු (එස්කැවේටර්, වීල් ලෝඩර්) - (IV ශ්‍රේණිය) - (තනතුරු 02)**

**අවශ්‍ය සුදුසුකම්**

- 08 ශ්‍රේණිය සමත් සහ මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ (MNRCE) හෝ ICTAD හෝ පිළිගත් ආයතනයකින් ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු සහතික පත්‍රයක් ලබා තිබීම

සහ

- එස්කැවේටර් (Excavator) හෝ වීල් ලෝඩර් (Wheel Loader) යන්ත්‍රෝපකරණ ක්‍රියා කරවීමේ හැකියාව සහිත වීම

සමඟ

- මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද බර වාහන යන්ත්‍රෝපකරණ පන්තියට අදාළව රියදුරු බලපත්‍රයක් සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයෙහි වසර 04 ක සේවා පළපුරුද්දක් සහිත වීම

**පැස්සුම්කරු (IV ශ්‍රේණිය) - (තනතුරු 02)**

**අවශ්‍ය සුදුසුකම්**

- 08 ශ්‍රේණිය සමත් සහ විදුලි කාර්මික ශිල්පය සහ ගෑස් වැද්දුම් ශිල්පය පිළිබඳ පූර්ණ කාලීන වශයෙන් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙහි (NAITA) හෝ ජාතික වෘත්තීය නිපුණතා මට්ටම 4 වන අදියර (NVQ 4) සාර්ථකව අවසන් කර තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් සපුරා තිබීම සමඟ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයෙහි වසර 04 ක සේවා පළපුරුද්දක් සහිත වීම

**සැ.යු. - කාර්මික ශිල්පි, විදුලි කාර්මික ශිල්පි, යන්ත්‍ර ක්‍රියාකරු සහ පැස්සුම්කරු යන තනතුරු සඳහා අයදුම් කරන්නන් ආයතනය මඟින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණය සමත්විය යුතුය.**

## වයස් සීමාව

- අවුරුදු 45 ට අඩු (දැනට රජයේ දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපැවැත්වේ.)

ඔබගේ සවිස්තරාත්මක අයදුම්පත 2021 ජූලි 29 වන දිනට පෙර පහත ලිපිනයට යොමු කරන්න. **(අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ තනතුර සඳහන් කරන්න.)**

**සාමාන්‍යාධිකාරී,**
**මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම,**
**නො: 81/4, නව නුගේ පාර, පැලියගොඩ, කැළණිය.**
**දුරකථන අංකය - 011-2914121 / ඊ.මේල් - mnrce@sltnet.lk**

Source: www.maganeguma.lk (2021.07.27)